# තාක්ෂණ අමාත්‍යංශය

# පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

## e-NIC ව්‍යාපෘතියේ ඇබෑර්තු

තාක්ෂණ අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියෙහි (ආයෝජනය ඇ. ඩොලර් මිලියන 50 ට ඉහළ හෝ ඊට සමාන හා ඇ. ඩොලර් මිලියන 100 ට නොඅඩු) පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ව්‍යාපෘති අධ්‍යක්ෂ : PS1 (තනතුරු 1යි)

**රැකියා පැතිකඩ**

- ➢ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) කළමනාකරණය කිරීම සහ ව්‍යාපෘති කටයුතු සාර්ථකව හා නියමිත කාලය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා එහි කාර්ය මණ්ඩලය මෙහෙයවීම.
- ➢ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හා වෙනත් අනුශාංගික නවීන තාක්ෂණික ක්‍රම සහ විධි පදනම්ව සකසා ඇති ව්‍යාපෘති අරමුණුවලට අනුකූල වන පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කිරීම හා යාවත්කාලීන කිරීම.
- ➢ ව්‍යාපෘතියේ වාර්ෂික සැලසුම් හා මානව සම්පත්, ප්‍රසම්පාදන, අධීක්ෂණ, අයවැය, කාලය යනාදී විෂයන්ට අදාළ වෙනත් ක්‍රියාකාරී සැලසුම් PIP මත පදනම්ව සකස් කිරීම හා යාවත්කාලීන කිරීමට පහසුකම් සැලසීම.
- ➢ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම (PIP) පරිදි ව්‍යාපෘති කටයුතු ග්‍රාම නිලධාරී (ග්‍රා.නි.), ප්‍රාදේශීය ලේකම් කාර්යාල (ප්‍රා.ලේ.), පළාත් කාර්යාල යන පරිපාලන ව්‍යුහයන් සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය (පු.ලි.දෙ.) හරහා සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන් ආවරණය වන පරිදි දීපව්‍යාප්තව ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම.
- ➢ ග්‍රාම නිලධාරී (ග්‍රා.නි) මට්ටමේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල (ප්‍රා.ලේ.), පළාත් කාර්යාල, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව (පු.ලි.දෙ) සහ අමාත්‍යංශය දක්වා විවිධ මට්ටම්වලදී ව්‍යාපෘති පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ➢ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට (PIP) අනුව භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සමස්ත අධීක්ෂණය.
- ➢ අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙළ කිරීම හා ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පනත් හා ඊට අදාළ රෙගුලාසි සංශෝධනයන් සම්බන්ධ කාර්යයන් සම්බන්ධීකරණය
- ➢ ව්‍යාපෘතියේ සමස්ත ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධිකරණය සහ අවශ්‍යතාවය අනුව ඇගයීම් කමිටු හා ප්‍රසම්පාදන කමිටුවලට සහභාගීවීම.

**අවශ්‍ය පළපුරුද්ද හා සුදුසුකම් (පහත 1 හෝ 2 හෝ 3)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් සාර්ථකව සම්පූර්ණ කළ  අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් සමාන සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබා ගත් ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකමක්

-සහ-

කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක් පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම හා එයින් වසර 06ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම.

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් සාර්ථකව සම්පූර්ණ කළ  අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සමාන සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/සමාන වෘත්තීය සුදුසුකමක්

-සහ-

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබා ගත් ආයතනික/ වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්

-සමඟ-

කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම සහ එයින් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් විය යුතුය.

03. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් සාර්ථකව සම්පූර්ණ කළ අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් සුදුසුකමක්

-සහ-

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්

-සමඟ-

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකමක්

-සමඟ-

කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 08ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම සහ එයින් වසර 04ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් විය යුතුය.

## ඇගයීම් හා නියාමන විශේෂඥ : PS3 (තනතුරු 1යි)

**රැකියා පැතිකඩ**

- ➢ සාමාන්‍ය සේවා සැපයුම් දත්ත වාර්තාකරණය, මූලික සහ අවසන් ඇගයීම් සහ ක්‍රියාවලි හා ප්‍රතිඵල ඇගයීම් නියාමනය ඇතුළු ව්‍යාපෘති කාර්ය සාධනය සහ ප්‍රතිඵල ලබාගැනීම සඳහා ව්‍යාපෘති අධීක්ෂණ සැලැස්ම සැකසීම , ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය.
- ➢ නියමිත කාලයට අනුව දත්ත රැස්කිරීම හා වාර්තාකරණය සිදු කිරීමට අදාළ වැඩසටහන් ක්‍රම සංවර්ධනය කිරීම හා අධීක්ෂණ සිදු කිරීම.
- ➢ ව්‍යාපෘතියේ අභිමතාර්ථ සහ එහි අනුරූප අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා ඇගයුම් හා නියාමනයන් මත අවශ්‍ය  මඟපෙන්වීම හා නායකත්වය ලබා දීම.
- ➢ තොරතුරු හා වාර්තාකරණ ක්‍රමවේදයන් හා එහි ක්‍රියා පිළිවෙළ ජාතික ඇගයීම් හා නියාමන මාර්ගෝපදේශයන්ට අනුකූලව උසස් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.
- ➢ ව්‍යාපෘතියේ තීරණ ගැනීමේ පාර්ශවයන් වෙත අවශ්‍ය ප්‍රතිචාර ලබාදීමේ කටයුතු සඳහා ලේඛන ප්‍රතිඵල ඇගයීම් හා නියාමනයන් සිදු කර මඟපෙන්වීමේ කටයුතු සඳහා මැදිහත් වීම.
- ➢ ව්‍යාපෘතිය හා සම්බන්ධ තොරතුරු ව්‍යාපෘති කණ්ඩායම අතර ප්‍රචාරණය හා ප්‍රවර්ධනය සඳහා සහය වීම
- ➢ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සහ මූල්‍ය ප්‍රගතිය නිරීක්ෂණය සහ සකස් කිරීමේ කටයුතු ව්‍යාපෘති මෙහෙයුම් හා මූල්‍ය කාර්ය මණ්ඩලය සමඟ  සිදු කිරීම.
- ➢ ඇගයීම් හා නියාමන කාර්ය මණ්ඩලයේ අධීක්ෂණ කටයුතු සිදු කිරීම.
- ➢ ව්‍යාපෘතියේ සියළුම ඇගයීම් හා නියාමන ධාරිතා වර්ධන කටයුතු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සහයකවරුන්, කාර්ය මණ්ඩලය හා පහසුකම් සපයන කාර්ය මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය කිරීම.
- ➢ සැලසුම සඳහා දායක වන තොරතුරු හා දර්ශක වල වලංගු භාවයේ තක්සේරු කිරීම් ඇතුළත්ව  මෙහෙවර හා කාර්ය සාධන ඇගයීම් සැලැස්ම (Mission Performance Monitoring Plan) සකස් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය
- ➢ වැඩසටහන් සමාලෝචන, කාර්යභාර නිරීක්ෂණය හා වෙනත්  ක්‍රියාමාර්ග හරහා ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය මගින් සහය අරමුණු / සංවර්ධන අරමුණු මුදුන් පමුණුවා ගැනීමෙහිලා නිත්‍ය ප්‍රගති සමාලෝචනයන් සම්බන්ධීකරණය කිරීම
- ➢ ව්‍යාපෘතියේ සෑම මට්ටමකම ක්‍රියාකාරකම්වල සියලු ඇගයීම් හා නියාමන කටයුතුවලදී ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත සහය වීම.

අවශ්‍ය පළපුරුද්ද හා සුදුසුකම් (පහත 1 හෝ 2 හෝ 3)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව සම්පූර්ණ කළ මූලික උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/සමාන වෘත්තීය සුදුසුකමක්

-සමඟ-

කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10ක පශ්චාත් පළපුරුද්ද

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව සම්පූර්ණ කළ මූලික උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අශ්‍රිත සාමජිකත්වය/සමාන වෘත්තීය සුදුසුකමක් සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ ආයතනික/ වරලත් සාමාජිකත්වයක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක්

-සමඟ-

කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 08ක පශ්චාත් පළපුරුද්ද

03. රජයේ දීපව්‍යාප්ත සේවාවේ 1 වන පන්තියේ නිලධාරියකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්වයේ තනතුරක් දැරීම

-සමඟ-

1 වන පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 03ක පශ්චාත් පළපුරුද්ද

**පොදු කොන්දේසි**

- **වැටුප් හා වෙනත් දීමනා 2019.03.05 දතම අංක 01/2019 කළමනාකරණ චක්‍රලේඛය මත පදනම් වේ.**
- **අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස 63ට වඩා වැඩි නොවිය යුතුය**
- **ව්‍යාපෘතිය මගින් සේවක අර්ථසාධක අරමුදලට 12%ක  දායකත්වයක් හා සේවකයා විසින් 8% ක දායකත්වයක් දරන අතර, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ව්‍යාපෘතිය මගින් 3% දායකත්වයක්ද දරනු ලැබේ.**
- **පත්වීම කොන්ත්‍රාත් පදනම මත වන අතර, ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත වාර්ෂික කාර්ය සාධන තක්සේරු කිරීමට යටත්ව අලුත් කරයි.**

සියලුම විස්තර සහිත අයදුම්පත්‍ර (සහතිකවල ඡායාපිටපත් සමඟ) ව්‍යාපෘති අධ්‍යක්ෂක, විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය, 10 වන මහල, "බී" පර්යන්තය, සුහුරුපාය, බත්තරමුල්ල යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් 2021 මැයි මස 15 දින හෝ ඊට පෙර එවිය යුතුය.

**ලේකම්,**
**තාක්ෂණ අමාත්‍යංශය.**